SALZBURG
GLOBAL
SEMINAR

EDUCATION FOR
TOMORROW'S WORLD

# The Salzburg Statement
## for Social and Emotional Learning
# සමාජීය සහ චිත්තවේගී ඉගෙනුම සඳහා සැල්ස්බර්ග් ප්‍රකාශනය

### ගෝලීය සන්ධානයක්

සමාජීය සහ චිත්තවේගී කුසලතා යනු තනි පුද්ගලයන්ට සිය හැඟීම් පාලනයට, අන්‍යයන් හා වැඩ කිරීමට සහ සිය ඉලක්ක සපුරා ගැනීමට ඉඩ ලබාදෙන ප්‍රධාන මිනිස් හැකියාවන්ය. ළමා වැඩිහිට සෑම දෙනකුගේ යහපැවැත්ම සහ සාර්ථකත්වය සඳහාත් සමාජයේ සහ ආර්ථිකයේ හෙට දවස උදෙසාත් මෙකී කුසලතා තීරණාත්මක වේ.

වේගයෙන් ඉදිරියට ඇදෙන සංකීර්ණ ලෝකයේ ඉදිරි අභියෝගයන් සහා අවස්ථා සඳහා සියලු සිසුන් සන්නද්ධ කරවීම අත්‍යාවශ්‍ය වේ. විධිමත් සහ අවිධිමත් අධ්‍යාපනයේ සමාජීය සහ චිත්තවේගී ඉගෙනුම (Social and Emotional Learning) අන්තරීකරණය කිරීමෙන් බහුවිද සහ දිගුකාලීන වාසි සැලසෙන බවට සාක්ෂි ඇත. සමාජීය සහ චිත්තවේගී ඉගෙනුම (SEL) පාසල්, රැකියා ස්ථාන, සහ ප්‍රජාවන් වඩාත් අන්තර්ගතික වීමට, ක්‍රියාශීලී වීමට, සහ ඵලදායි වීමට SEL බෙහෙවින් දායක වන අතර දිගුකාලීනව රාජ්‍ය මුදල් ඉතුරු කිරීමටත් ඵලදායිතාව වේගවත් කිරීමටත් හැකි වනු ඇත.

ගෝලීය සහ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති, පරිචය, පද්ධති සහ මිනිස් උපතේ සිටම "පරිපූර්ණ පුද්ගල" සංවර්ධනය මධ්‍යයේ SEL අන්තර්ගතව තිබිය යුතු බව අපි විශ්වාස කරන්නෙමු.

මෙම පරිණාමය වේගවත් කිරීම සඳහා 2018 දෙසැම්බර් මස පැවති *"සමාජීය සහ චිත්තවේගී ඉගෙනුම: ගෝලීය සහවාදයක්" (Social and Emotional Learning: A Global Synthesis* (www.salzburgglobal.org/go/603) වැඩසටහනෙහි සැල්ස්බර්ග් ගෝලීය ප්‍රජාව මෙම කර්තව්‍ය ඉදිරියට ගෙන යාමට නව ගෝලීය සන්ධානයක් දියත් කර ඇත. ගෝලීය සන්ධාන සතුව අරමුණු සතරකි.

- SEL පිළිබඳව ලොව පුරා දැනුවත් කිරීම;
- සහයෝගී ව්‍යාපෘති සහ සිද්ධි සඳහා පහසුකම් සැලසීම;
- ඉහළ ගුණාත්මකබවකින් යුතු සම්පත් අධ්‍යාපකයන් හට සපයා දීම;
- SEL උදෙසා වන අති නවීන පර්යේෂණ සඳහා සහාය වීම.

වැඩිදුර තොරතුරු සඳහා: www.karanga.org

### ක්‍රියාකිරීමේ අවශ්‍යතාවය

ලොව පුරා රටවල් තම තරුණ ප්‍රජාව රැකියාවන්, ප්‍රීතිමත් ජීවිත හා ජීවිතය යනාදිය සඳහා සූදානම් කරවන මෙන්ම, ඔවුන් තම සමාජය වෙනුවෙන් සක්‍රීයව දායකත්වයක් සැපයීමට පොළඹවන අධ්‍යාපන පද්ධති ළඟාකර ගැනීමට මහත් පරිශ්‍රමයක් දරයි. කෙසේහෝ, මෙම ඉලක්ක සපුරාලීමට හෝ තිරසාර සංවර්ධන අරමුණු වල (Sustainable Development Goals) අභියෝගයන් සඳහා නැගී සිටීමට සමාජයන්ට උපකාර කිරීම සඳහා වූ වෙනස අවශ්‍ය ඉක්මනින් සහ පුළුල් ලෙස ඇති වන්නේ නැත. මේ පිළිබද මූලිකවම සැලකිල්ලක් දැක් විය යුතු අවස්ථා පහත දැක්වේ.

- **රැකියාවේ හෙට දවස**: ඉක්මනින් වෙනස් වන අර්ථ ක්‍රම සහ ඩිජිටල් විප්ලවය සඳහා සියලු තරුණ ප්‍රජාව කුසලතා සහ දක්ෂතාවලින් සන්නද්ධ කිරීම අධ්‍යාපනයට සිදු කළ හැක්කේ කෙසේද?
- **නව්‍යතා ධාරිතාව**: මුලපිරීම, ප්‍රත්‍යාස්ථිතිය, සහ ව්‍යවසායකත්ව හැඟීම පෝෂණය කිරීම පාසල්වලට කළ හැක්කේ කෙසේද?
- **අධ්‍යාපන උපාර්ජනය**: ඕනෑම සන්දර්භයකදී අපට ඉගෙනුම් ඵල වැඩි දියුණු කර ගත හැක්කේ කෙසේද? විශේෂයෙන් ම සමාජ අන්තයේ අර්බුද සහ අනේක විදි අවස්ථා මැද ජීවත් වන ළමුන් සහ වැඩිහිටියන් සඳහා.
- **මානසික සෞඛ්‍යය**: ලොව පුරා වෙසෙන නවයෞවනයන්ගේ අසනීප සහ ආබාධිත තත්ත්වයන් සඳහා විෂාදය එක හේතුවක්වී ඇති අතර, මනෝවිද්‍යාත්මක යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීමට සහ මානසික සෞඛ්‍ය අපහසුතා අවම කිරීමට අධ්‍යාපනයට කළ හැක්කේ කුමක්ද?
- **සමාජ ඒකාබද්ධතාව**: පෙර කෙදිනකටවත් වඩා අස්ථිර සහ ඛණ්ඩිත භාවයකින් යුතු සමාජයන් තුළ, තරුණ ප්‍රජාවට සිය අනන්‍යතාව පිළිබඳව විශ්වාසයක් ඇති කිරිමටත්, ඔවුන් දේශීය හා ගෝලීය මට්ටමේ ප්‍රජාවන් පිළිබඳව උනන්දුවක් සහ අවධානයක් ඇතිව ජීවත් වීමටත් උපකාර කර හැක්කේ කෙසේද?

SalzburgGlobal.org සැල්ස්බර්ග් ගෝලීය සම්මේලනයේ සාමාජිකයන් (Salzburg Global Fellows) විසින් රචිත සමාජීය සහ චිත්තවේගී ඉගෙනුම සඳහා වන සැල්ස්බර්ග් ප්‍රකාශනය සිංහල භාෂාවට පරිවර්තනය කරන ලද්දේ Educate Lanka පදනම විසිනි. Educate Lanka පදනම සැල්ස්බර්ග් ගෝලීය සම්මේලනයේ සාමාජිකයෙක් වන අතර මෙම ප්‍රකාශනය සඳහා දායක වූ සංවිධානයකි.

## SEL පිළිබඳව මූලික පණිවුඩ

### ළමුන්
අපට එකට එක් වී පාසල් වඩාත් ආරක්‍ෂිත සහ කරුණාවන්ත ස්ථාන බවට පත් කළ හැකිය. අධ්‍යාපනය අනෙකා සමඟ බෙදා ගත් විට විනෝදජනකය. ඔබට ඔබ පිළිබඳව හොඳ හැඟීමක් ඇති කර ගැනීමට, ඔබට වඩා හොඳින් වැඩ කිරීමට සහ ඔබගේ ඉලක්ක සපුරා ගැනීමට සමාජීය සහ චිත්තවේගී කුසලතා උපකාරී වේ.

### දෙමව්පියන්
පවුල තුළ SEL පෝෂණය කිරීම හා පාසල් තුළ එම ඉගනීම් කෙරෙහි උනන්දුවක් ඇති කිරීම සඳහා ඔබට වැදගත් භූමිකාවක් හිමි වේ. වඩාත් සමබර සහා සතුටින් පිරි ළමුන් පෝෂණය කිරීම උදෙසා අධ්‍යපන වටපිටාවන්ට SEL මහත් සේ උපකාරී වේ. ඔබගේ දරුවාට ලෝකය අභිමුව ශිල්ප දැක්වීම සඳහා සමාජීය සහ චිත්තවේගී කුසලතා උපකාරී වනු ඇත.

### ප්‍රජාවන්
ගෞරවය, අභිමානය, හිමිකාරිත්ව හැඟීම් වැනි වැදගත් සංකල්ප වර්ධනය කිරීම තුලින් SEL ප්‍රජා ඒකාබද්ධතාවය සදහා සහය වන අතර, විචක්ෂණශීලි, සමෘද්ධිමත්, සහ නවෝත්පාදනීය ප්‍රජාවන් සඳහාද SEL බෙහෙවින් ආධාර වේ.

### ගුරුවරු
SEL, ශිෂ්‍යන්ගේ සමස්ත ඉගනීම, අවබෝදය, සබැඳියාවන් වර්ධනය, සහ යහපැවැත්ම කේන්ද්‍ර වන පරිදි ඒ වූ ගුණාංග තීව්ර කරනු ඇත. SEL-ආධාරිත ඉගැන්වීම තුළින් ගුරුවරුන්ට ශිෂ්‍යයන් සමඟ මනා සබඳතාවක් ගොඩ නගා ගැනීමට හැකිවනු ඇති අතර, SEL-ආධාරිත ඉගැන්වීම වඩාත් ප්‍රීතිමත්, ඉෂ්ටඵලදායී සහ සාධනීය වේ.

### අධ්‍යාපන නායකයන්
ගුරුවරුන්ගේ කාර්යසාධකත්වය සහ අභිප්‍රේරණය SEL එළඹුම් මගින් වැඩි දියුණු කරයි. ගුරුවරුන් දිගු කාලීනව රඳවා තබාගැනීමටත් ඔවුන්ගේ යහපැවැත්ම උදෙසාත් SEL එළඹුම් ධනාත්මකව බලපානු ඇත.

### ව්‍යාපාර
අනාගත අර්ථ ක්‍රමවලට සහ රැකියාවන්ට සමාජීය සහ චිත්තවේගී සාක්ෂර ශ්‍රම බලකා අවශ්‍ය වනු ඇත. පාසල්වල සහ සේවා ස්ථානවල SEL වැඩසටහන්වලට ආයෝජනය කිරීම අනාගත වැඩ ලෝකයේ ඉල්ලුම් සහ අභියෝගවලට මුහුණ දිය හැකි, වඩාත් අභිප්‍රේරිත සහ නිපුණත්වයෙන් යුතු ශ්‍රම බලකායක් නිර්මාණය කිරීමට උපකාරී වනු ඇත.

### ප්‍රතිපත්ති සම්පාදකයන්
ජනසමාජයන්ගේ සහ අර්ථ ක්‍රමවල වෙනස්වන අවශ්‍යතාවලට මුහුණ දීමට පුරවැසියන්ගේ ඇති හැකියාව SEL වැඩසටහන් මගින් වැඩි දියුණු කරනු ලැබේ. SEL සඳහා කෙරෙන ආයෝජන කෙටිකාලීනව සහ දිගුකාලීනව රාජ්‍ය මුදල් ඉතුරු කරනු ඇත.

## කඩිනම් වෙනසක් උදෙසා ප්‍රමුඛතා

ලොව වටා වැඩෙන පර්යේෂණ සමූහයකට අනුව පෙනෙන පරිදි සමාජීය සහ චිත්තවේගී ඉගෙනුම් (SEL) වැඩසටහන්වලට ඉහත සඳහන් කළ මූලික කාරණාවලට පිළිතුරු දිය හැකි අතර පුද්ගලයන්ට සහ සමාජයට පුළුල් පරාසයක විහිදෙන දිගුකාලීන වාසි ලබා දීමට හැකි වනු ඇත. කෙසේ නමුත්, මෙකී තර්කය තවමත් ජය ගෙන නොමැත. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා ලෝකයේ හොඳම සහ වඩාත්ම පිරිවැය සඵලතාවෙන් යුත් අවස්ථාව ලෙස SEL ස්ථානගත කිරීම මෙම ප්‍රකාශනයේ අරමුණයි.

මෙය සාක්ෂාත් කිරීම සඳහා පොදු අභියෝග තුනකට පිළිතුරු සැපයීම අවශ්‍ය වේ (සැබෑ සහ ප්‍රත්‍යක්ෂ):

- ගුරුවරයන්ගේ සූදානම් භාවය SEL පිළිබඳව වැඩිහිටියන්ගේ අවබෝදය සහ ඒ පිළිබඳව ඒ අයගේ අගය කිරීම;
- විෂයමාලා නිර්මාණය, විෂයමාලා අන්තර්ගතය සහ විෂය බාහිර ඉගෙනුම් අවස්ථාවල පිළිගැනීම; සහ
- SEL මැනීම සහ තක්සේරු කිරීම.

ලොව නන් දෙස වෙසෙන අධ්‍යාපන නායකයෝ සහ නවෝත්පාදකයෝ මේ වන විටත් මේ පිළිබඳව විසඳුම් ගොඩනැගීම හා ඒ පිළිබඳව පවතින පද්ධති පරිණාමනය කිරීම සාර්ථකත්වයකින් යුතුව සිදු කරමින් සිටිති.

දැන් එළඹ ඇත්තේ මෙම කර්තව්‍ය මහා පරිමාණයෙන් සිදුකිරීමයි. සියලු ළමුන්ට SEL අවස්ථා ලබා දීමට නම් අපි ප්‍රමුඛතා දෙකකට අවදානය යොමු කළ යුත්තෙමු:

1. **SEL හි වැදගත්කම සහ අවශ්‍යතාවය මුල්කොට එය ක්‍රමානුකූලව අධ්‍යාපන ප්‍රතිපත්ති තුළත් ඊට පරිබාහිරයෙනුත් අන්තර්ගත කිරීමට ඉල්ලුමක් ගොඩනැගීම.**

2. **SEL පිළිබඳව ලොව වටා ඇති හොඳම භාවිතයන් සහ පරිචයන් අනුගත කර ගැනීමටත් ඒවා කෙරෙහි පෙළඹීමක් ඇති කරගැනීමටත්, එම භාවිතයන්ගේ සහ පරිචයන්ගේ සාර්ථක අංග සහ එම අංග සාර්ථක වන්නේ කෙසේද යන්නත් අවධාරණය කිරීම.**




SalzburgGlobal.org සැල්ස්බර්ග් ගෝලීය සම්මේලනයේ සාමාජිකයන් (Salzburg Global Fellows) විසින් රචිත සමාජීය සහ චිත්තවේගී ඉගෙනුම සඳහා වන සැල්ස්බර්ග් ප්‍රකාශනය සිංහල භාෂාවට පරිවර්තනය කරන ලද්දේ Educate Lanka පදනම විසිනි. Educate Lanka පදනම සැල්ස්බර්ග් ගෝලීය සම්මේලනයේ සාමාජිකයෙක් වන අතර මෙම ප්‍රකාශනය සඳහා දායක වූ සංවිධානයකි.

## සියලු දෙනාටම අධ්‍යාපනය පරිණාමනය කිරීම:
## ප්‍රතිපත්ති සහ නිර්දේශ

### අධ්‍යාපන විද්‍යාව, විෂයමාලාව සහ තක්සේරුව

සෑම අධ්‍යාපන පද්ධතියකම පැහැදිලිවම SEL මුල් ළමා වියේ සිට නවයොවුන් සහ වැඩිහිටි යන සියලු වයස් මට්ටම්වල අධ්‍යාපන විද්‍යාව, විෂයමාලා, සහ අධ්‍යාපනික තක්සේරු භාවිතවල දී අන්තර්ගත කළ යුතුය. මෙකී කටයුතු ඉක්මණින් කළ හැකි පමණට අගනේය. ඒකී එක් අංශයක් අතහැර අනෙක් අංශ සඳහා කරන ආයෝජනයන්ගෙන් බලාපොරොත්තු වූ විපර්යාසයන් ලඟා කරගැනීමට නොහැකිවනු ඇත.

SEL ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන විද්‍යා ප්‍රවේශයන්, පරිචයන්, විෂයමාලා සහ අධ්‍යාපනික තක්සේරු එළඹුම් ගෝලීය සාක්ෂි මත විවධ සංස්කෘතික තැකීම් පිළිබිඹු කිරීම සඳහා රට රටවල සන්දර්භවලට අනුකූල විය යුතුය.

SEL සඳහා ශාරීරික සහ මානසික සුරක්ෂිතතාව තහවරු වන ඉගැනුම් සහ පාසල් වටපිටාවක් අවශ්‍යය. SEL පුහුණුව ගුරුවරයාගේ යහපැවැත්ම සහ සිය ශිෂ්‍යයන් සමඟ ඔවුන්ගේ සම්බන්ධතාව කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කරයි. එය ශිෂ්‍යන්ගේ ප්‍රතිඵල කෙරෙහි ධනාත්මක වශයෙන් බලපායි. ගුරුවරු සහ ශිෂ්‍යයන් අතර සම්බන්ධය, සහ ගුරුවරුන්ගේ සමාජීය සහ චිත්තවේගාත්මක යහපැවැත්ම, ශිෂ්‍යන්ගේ සහ ගුරුවරුන්ගේ යන දෙපිරිසගේම සාර්ථකත්වය සඳහා තීරණාත්මක වේ.

මිනිසුන් (ශිෂ්‍යයන්, දෙමව්පියන්, ආණ්ඩු සහ මහජනතාව) අධ්‍යාපනයේ ඇති වැදගත් දේ නිශ්චය කරන ආකාරය සඳහා අධ්‍යාපන තක්සේරු බලපෑම් කරනු ඇත. එම නිසා අධ්‍යාපන පරීක්ෂණවල නිර්මාණය සහ විෂය පථය යන දෑ දිගුකාලීන සමාජ සහ වෘත්තීය ඇඟවුම් මතු කරයි.

මෙටා-විශ්ලේෂණ පෙන්වන පරිදි සමාජීය සහ චිත්තවේගාත්මක කුසලතා යනු කෙටිකාලීනසහ දිගුකාලීන ඉගෙනුම් ඵල, ශ්‍රම බලකා සූදානම, සෞඛ්‍යය සහ යහපැවැත්ම යනාදිය පිළිබඳ මනා පුරෝකථකයන් වේ. කෙසේ හෝ, මෙම කුසලතා බොහෝ තක්සේරු සහ මිනුම් වැඩසටහන්වල දී සලකා නොබැලෙන බව දැකිය හැකිය.

සියලු ළමුන්ට සමාජීය සහ චිත්තවේගී ඉගෙනුම් අවස්ථා සඳහා ප්‍රවේශයන් තිබිය යුතු බව අපි විශ්වාස කරන්නෙමු. එම නිසා, සියලු තක්සේරු පද්ධතිවලට SEL තක්සේරුව කාවැද්දීම අවශ්‍ය වේ. ප්‍රකරණබද්ධව සුවිශේෂ වූ සමාජීය චිත්තවේගී ඉගැනීම් වල ප්‍රගමනය වලංගු කිරීම සහ වර්ධනය කිරීම මෙම ක්ෂේත්‍රයේ වැදගත් ඉදිරි පියවරක් වනු ඇත.

### ප්‍රජාව

පවුල් සහ ප්‍රජා පාදක අධ්‍යාපනය විධිමත් අධ්‍යාපනයෙන් ඔබ්බට ගොස් උසස් බලපෑමක් ඇති කරවන අවස්ථා නිර්මාණය කරයි. සමාජයේ අතපසු වූ ප්‍රජාවන් කරා ළඟා වීමේ හැකියාවක් එය සතු අතර, එම නිසා අවස්ථා අතර ඇති පරතරය අඩු කිරීමට SEL උපකාරී වේ.

සමහර අවස්ථාවල SEL සඳහා ඇති එකම අවකාශය ප්‍රජාව විය හැකිය. SEL එළඹුම් අව්‍යාජ ලෙස, සන්දර්භගතව අදාළ, හා ප්‍රජා කේන්ද්‍ර කොට ගත් විට, ප්‍රජාවන්ට SEL පෝෂණය කර සවිබල ගැන්වීමට පුළුවන.

### අර්බුදකාරී සහ ගැටුම්කාරී සන්දර්භයකදී අධ්‍යාපනය

මුල් ළමා වියේ සිට වැඩිහිටි විය දක්වා සියලු ශිෂ්‍යයන්ට අධ්‍යාපනයේ සියලු මාදිලි තුළ SEL ඒකාබද්ධ කිරීම තීරණාත්මක වේ. අර්බුද, ගැටුම් සහ ප්‍රචණ්ඩත්වය නිසා බලපෑමට ලක් වූ අයට විශේෂයෙන් එය වැදගත් වේ. අර්බුද සහ ගැටුම්වලින් පීඩාවට පත් රටවල අධ්‍යාපන වැඩසටහන්වලට SEL ඒකාබද්ධ කරන ආකාරය පිළිබඳ සමහර ප්‍රායෝගික මාර්ගෝපදේශන ඇතත්, පර්යේෂණ, භාවිතයන්/පරිචයන්, සහා ඊට අදාළ ප්‍රතිපත්තීන් මූලික කොට, ඒවා වැඩිදුර වර්ධනය කිරීමට අවශ්‍යව ඇත.

ආශ්‍රිත ග්‍රන්ථ අන්තර්ජාලයෙන් ලබා ගත හැකිය:
www.salzburgglobal.org/go/education

SalzburgGlobal.org සැල්ස්බර්ග් ගෝලීය සම්මේලනයේ සාමාජිකයන් (Salzburg Global Fellows) විසින් රචිත සමාජීය සහ චිත්තවේගී ඉගෙනුම සඳහා වන සැල්ස්බර්ග් ප්‍රකාශනය සිංහල භාෂාවට පරිවර්තනය කරන ලද්දේ Educate Lanka පදනම විසිනි. Educate Lanka පදනම සැල්ස්බර්ග් ගෝලීය සම්මේලනයේ සාමාජිකයෙක් වන අතර මෙම ප්‍රකාශනය සඳහා දායක වූ සංවිධානයකි.